පාර්ලිමේන්තුව

பாராளுமன்றம்

**PARLIAMENT**

ආචාර්ය විජයදාස රාජපක්ෂ
ජනාධිපති නීතිඥ
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය

2024 ජුනි මස 25වන දිනදිය

අතිනි

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

<u>පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් බරපතල ලෙස වරප්‍රසාද, පරිහාර සහ බලතල උල්ලංඝනය කිරීම පිළිබඳ ව වන පැමිණිල්ලයි</u>

මම අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අතර 2024 ජුනි මස 19 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මහතා විසින් අධිකරණයන්ට අදාලව නගන ලද ප්‍රශ්න කිහිපයක් අලලා පිළිතුරු දෙමින් පහත සඳහන් කරුණු පිළිබඳ ව තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළෙමි. මම සඳහන් කල කරුණු අතර පහත සඳහන් කරුණු කිහිපයක් මෙහි සඳහන් කරමි.

1. ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරයා හැර අනෙකුත් විනිසුරුවරුන් සඳහා වන ඇබෑර්තුවක කිසිදු තනතුරක් පිරවීමෙන් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා සහ ගරු කථානායකවරයාගේ සභාපතිත්වයෙන් යුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලු සාමාජිකයන් වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කර ඇති අතුරු නියෝගය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් පත් කිරීම සම්බන්ධව වන 41(අ) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අත්හිටුවීමක් වන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුලුමනින් හෝ එහි කොටසක් හෝ අත්හිටුවීම සඳහා නියෝගයක් ලබා දීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලයක් නොමැති බව මම සඳහන් කළෙමි. මීට පෙර එවැනි අවස්ථාවක් වූයේ දෙවන ලෝක යුද්ධය ආරම්භයේ ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් වෙමර්ස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිවිල් අයිතිවාසිකම් පරිච්ඡේදය අත්හිටුවීමයි.

Scanned with CamScanner

2. වර්තමාන ගරු දිසා විනිසුරුතුමිය ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ පිහිටි නිල නිවසට පැමිණීමට පෙර එහි සිටි මහේස්ත්‍රාත්වරයා එම අධිකරණයේ නිල නිවසට අධිකරණ ආරක්ෂක මුර කුටියේ පැවති විදුලි රැහැන්වලින් නීති විරෝධී ලෙස විදුලිය සැපයීමක් සිදු කර ඇති බවට පැමිනිලිකොට ඇත. ඊට පෙර එම අනවසර විදුලි රැහැන් වලින් විදුලි කාර්මිකයකුට විදුලි සැර වැදී බරපතළ ජීවිත අනතුරකට පත්ව අපහසුවෙන් ජීවිතය බේරාගත් බව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්ය මණ්ඩලය 2024.04.16 දින මා වෙත දන්වා සිටින ලදී. එකී කාරණා ගරු දිසා විනිසුරුතුමිය කොළඹ මහාධිකරණ විනිසුරුතුමාට දන්වා සිටියත්, ඒ පිළිබඳ විමර්ශනය කිරීමේ බලයක් එතුමාට නොතිබූ බව දන්වා, එම බලය ඇත්තේ අධිකරණ අමාත්‍යාංශයට බව දන්වා ඇත.

ඒ පිළිබඳ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා, අතිරේඛ ලේකම් (පාලන), අතිරේඛ ලේකම් (ඉංජිනේරු) යන නිලධාරීන් පත්කොට ලබාගත් වාර්තා අනුව අධිකරණ සංකීර්ණයේ විදුලි පද්ධතියේ විදුලි රැහැන් වලින් නීති විරෝධී ලෙස විනිසුරු බංගලාවට විදුලිය ලබාගෙන ඇති බවත්, එම ආකාරයෙන් ම අධිකරණ සංකීර්ණයේ ජල ටැංකියට ද සූක්ෂ්ම ලෙස විදුලි රැහැන් ඇද සම්බන්ධ කොට තිබූ බවත් වාර්තා කොට ඇත. තව ද අධිකරණ පද්ධතියේ ජල නල පද්ධතියෙන් ද එම ආකාරයෙන් ම නීති විරෝධී ලෙස ජල නලයක් සවි කොට ජලය ලබාගෙන තිබූ බව තහවුරු කොට ඇත.

අදාළ සියලු ලිපිලේඛන 2024.05.03 වන දින අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට බාරදුන් නමුත් ඔහු කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර එම සිද්ධිය අලලා අධිකරණය බරපතළ ලෙස මාධ්‍ය තුළින් විවේචනයට ලක් විය. එසේ හෙයින් එම කාරණය පිළිබඳ පාර්ලිමේන්තුව දැනුවත් කිරීම මාගේ යුතුකමක් වූ හෙයින් එම ප්‍රකාශය සිදු කළෙමි.

3. 2022 මැද භාගයේ සිට 2024 දක්වා කාලය තුළ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ කාමරයේ තිබූ රුපියල් කෝටි 20 ක් (රු. ලක්ෂ 2,000 ක්) පමණ වටිනා විස්කි තොගයක් නඩු භාණ්ඩ කාමරය හොරුන් කඩා ඉවත්කර ගෙන ගොස් ඇති බවට නිලධාරීන් පැමිණිලි කොට තිබුණත්, එම දොර විවෘත කර ඇත්තේ එම දොරේ සවිකර තිබූ ලොක් එකේ නියමිත යතුරෙන් බව රජයේ රස පරීක්ෂකවරයා වාර්තා කොට ඇත. එහි බරපතළ වංචාවක් සිදු වී ඇති නමුත් එහි සිටි විනිසුරුවරයා හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව කිසිදු පියවරක් නොගෙන ඇති අතර එය අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා විසින් යටගසා ඇති බව එහි සේවය කරන නීතිඥ කණ්ඩායමක් මා වෙත ලිඛිතව දැනුම් දී ඇත.

4. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අභිනවයෙන් වැඩ බාරගත් මහේස්ත්‍රාත්වරයා සොයා ගෙන තිබුණේ එහි පවතින, සේවකයින් විසින් රාජකාරි වාර්තා කිරීම සඳහා පවත්වා ගෙන යන ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වෙලාව පැය ½ ක් අඩු කොට වංචනික ලෙස සකස් කර ඇති බව ය. ඒ පිළිබඳ ජනමාධ්‍යයෙන් ද විශාල ප්‍රචාරයක් ලැබුණි.

Scanned with CamScanner

5. කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නීතිඥවරු ජනාධිපති ලේකම්තුමාට බාර දී ඇති ලේඛනයේ සඳහන් පරිදි හෙරොයින්, අයිස්, ගංජා වැනි මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් නඩු 16 ක තොරතුරු අනුව එම වරදවල්වලට දඩුවම් ලෙස රු. 1000 ක දඩයක් නියම කොට එය නොගෙවුවහොත් එදිනම සවස 2 ට හෝ 3 ට මුදා හරින ලෙස නියෝග කොට ඇත. ගල්කිස්ස අධිකරණයේ අනවසර විදුලි සහ ජලය ගැනීම සම්බන්ධව චෝදනා ඇත්තේ ද මෙම විනිසුරුවරයාට එරෙහිවය.

මෙම කාරණය මා විසින් ඉදිරිපත් කළ අතර එහි සඳහන් යම් කාරණා සම්බන්ධව නීතිමය තත්ත්වය පැහැදිලි කිරීමක් සභානායක අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා විසින් ද සිදු කරන ලදී.

එකී ප්‍රකාශය සම්බන්ධව අධිකරණ සේවා සංගමයේ සභාපති ලෙස දිසා විනිසුරු ගරු රුවන් දිසානායක මහතා සහ ලේකම් ලෙස ගරු ඉසුරු නෙත්තිකුමාරගේ මහතා විසින් 2024 ජූනි 24 වන දින නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනය අනුව මා විසින් වගකීම් විරහිතව වෛරී සහගතව සිදුකරන ලද්දක් බව සඳහන් කර ඇත. තවද එය අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා ඉවත් කිරීම සඳහා සිදුකළ ව්‍යාපෘතියක් ලෙස ද හඳුන්වා ඇත. ඉහත කී චෝදනා වලට එම කොමිසමේ ලේකම්වරයාගේ යම් රැකවරණයක් ලැබී ඇති බව එම නිවේදනය මගින් ම තහවුරු කර ඇත. එම මාධ්‍ය නිවේදනයේ පිටපතක් "X 1" ලෙස මීට අමුණා ඇත.

2010 සැප්තැම්බර් 01 දින අධිකරණ සේවා කොමිෂන් සභාව නිකුත් කළ අංක 328 දරන චක්‍රලේඛය මගින් සියලු ම දිසා අධිකරණ විනිසුරුවරු සහ මහේස්ත්‍රාත්වරු වෙත දන්වා ඇත්තේ ප්‍රසිද්ධ ප්‍රකාශ සිදු කිරීමෙන් එම විනිසුරුවරුන් වැළකී සිටිය යුතු බවත්, එය උල්ලංඝනය කළහොත් විනයානුකූල පියවර ගන්නා බවත් ය.

2016 සැප්තැම්බර් 30 දින එවකට අගවිනිසුරුවරයා නිකුත් කර ඇති 2016 අංක 02 දරන චක්‍රලේඛයේ සඳහන් වන්නේත

'05. Every High Court Judge shall not appear or release any statement to the print or electronic media including social media network.'

06. Every High Court Judge shall not make unnecessary or irrelevant comments/utterances/statements during court proceedings'

එය උල්ලංඝනය කළහොත් විනයානුකූල පියවර ගන්නා බව ද සඳහන්ව ඇත.

ඉහත කී චක්‍රලේඛන දෙකෙහි පිටපත් " X 2" සහ " X 3" ලෙස මීට අමුණා ඇත.

මා විසින් සඳහන් කළ ඉහත කී සාපරාධී ක්‍රියා සම්බන්ධව මේ වන විටත් විමර්ෂණ ආරම්භ කර තිබිය දී එම පරීක්ෂණ ක්‍රියාවලිය කඩාකප්පල් කොට යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලිය අඩපණ කිරීමේ උත්සාහයක් එම මාධ්‍ය නිවේදනය නිකුත් කළ විනිසුරුවරුන් දෙදෙනා සිදුකරමින් සිටී.

මීට පෙරද අවස්ථා ගණනකදී නෙත්තිකුමාරගේ විනිසුරුවරයා ඉහත කී සිද්ධි වලට අදාල විමර්ශණ කඩාකප්පල් කිරීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කළ අතර ඔහු අධිකරණ සේවා

Scanned with CamScanner

කොමිසමට ලියන ලද ලිපි කොමිසමට භාර දීමට පෙර එක් දේශපාලන පක්ෂයක් විසින් ඔවුන්ගේ මාධ්‍ය සාකච්ඡාවලදී පෙන්වා සිටියේ ය.

ඉහත කී ගරු ඉසුරු නෙත්තිකුමාරගේ මහතා ගාල්ල මහේස්ත්‍රත්වරයා ලෙස සිදුකරණ ලද නීති විරෝධී ක්‍රියාවන් රාශියක් ගාල්ල අධිකරණයේ නීතිඥවරුන් අධිකරණ සේවා කොමිෂන් සභාවට පැමිණිලි කල නමුත් කොමිෂන් සභාව කිසිදු පියවරක් නොගත් බවත් මා වෙත දන්වා ඇත.

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු වන භාරත තෙන්නකෝන් මහතා විසින් “සුදුපාට ගැන්ස්ටර්ස්” නමින් සමාජ මාධ්‍යට මුදාහල විනාඩි 30 යි තත්පර 56 ක වීඩියෝ පටය පසුගිය ජනවාරි මාසයේ සිට සමාජ මාධ්‍යයේ සංසරණය වේ. කරාපිටිය මහ රෝහලේ ඉතා ගෞරවනීය විශේෂඥ පිළිකා ශෛල්‍ය වෛද්‍යවරයෙකු වන ක්‍රිෂාන්ත පෙරේරා මහතා එම රෝහලේ ජ.වි.පෙ. වෘත්තිය සමිති සාමාජිකයෙකු වන කම්කරුවකුගේ හැසිරීම පළිබදව පැමිණිල්ලක් කල නමුත් වෛද්‍යවරයා වූදිතයෙකු කොට ඔහු සුළු සේවකයා හට පහර දුන් බවට සුලු පැමිණිල්ලක් ඉදිරිපත් වූ බවත්, එය සමථ මංඩලයකින් පවා සමථකල හැකිව තිබූ බවත් සදහන් කරයි. එහෙත් ගාල්ල මහේස්ත්‍රාත්වරයා අංක 23835 දරණ එම නඩුව විමසුමට ගත් අවස්ථාවේ කටයුතු කරන ලද්දේ විනිසුරුවරයෙකු ලෙස නොව චන්ඩියෙකු ලෙසින් මුලුමනින්ම යුක්තිය අපගමනය වන ලෙස බව සදහන් කරයි. විනිසුරුවරයා එම වෛද්‍යවරයා අමතමින් “මම තමුසෙට පාඩමක් උගන්නම්, තමුසෙට මේ නඩුව ඇපිල් කරන්න බෑ” යනුවෙන් පවසා දොස්වරයා සිරගත කොට ඇත. ඉහල අධිකරණය එම තීංදුව නීති විරෝධී බවට තීංදු කොට අවලංගු කර ඇත. එම වෛද්‍යවරයාට අධිකරණයේදී සිදු වූ නින්දා අපහාස නිසා කලකිරී රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන ඇත. එම වීඩියෝව YOU TUBE හි මාස හයකටත් වැඩි කාලයක් සංසරණය වෙමින් පවතින අතර විශාල ජනකායක් එය අසා නරබා ඇත. එහෙත් එම විනිසුරුවරයා අද දක්වාම අඩු තරමින් එය බොරුවක්යයිවත් පවසා නැත. අධිකරණ සේවා කොමිසමට පැමිණිල්ලක්වත් කර නොමැති බව මගේ විශ්වාසයයි. එය අධිකරණය පිළිබද ජනතා විශ්වාසය බරපතල ලෙස බිඳ වැටුන අවස්තාවකි. එම වීඩියෝවේ සංයුක්ත තැටිවයක් “X 4” ලෙස අමුණා මේ සමග ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ජනරජයේ ජනතාවගේ අධිකරණ බලය පිළිබඳ අවසාන වගකීම පැවරී ඇත්තේ පාර්ලිමේන්තුවට ය. පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව පවරා දෙනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම අධිකරණය විසින් සිදුකරනු ලබයි. එම අධිකරණ ක්‍රියාවලිය අනීතික ලෙස සිදු කරනු ලබන්නේ නම් හෝ අයුතු ලෙස යොදාගනු ලබන්නේ නම් ඒ පිළිබඳ පාර්ලිමේන්තුව දැනුවත් කරමින් ඒ හරහා ජනතාවට දැනුවත් වීමට අවස්ථාව ලබා දීම අධිකරණ අමාත්‍යවරයා වෙත පැවරී ඇති අනුල්ලංඝනීය වගකීමක් වේ.

ඉහත කී කාරණා පිළිබද සත්‍ය සොයා බලා නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීම අධිකරණ ක්ෂේත්‍රයේ සියලු විනිසුරුවරුන්ගේ සහ නිලධාරීන්ගේ වගකීමක් ව තිබිය දී එම කරුණු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ද්වේශ සහගතව මාධ්‍යයට ප්‍රකාශ නිකුත් කිරීමට කිසිවකුටත් අයිතිවාසිකමක් නොමැත.

අද අධිකරණයේ පවතින මෙම තත්ත්වය පිළිබද ව රට දැනුවත් කිරීම සඳහා මා කටයුතු කිරීම සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ක්‍රියාකලාපය නිසා දැඩි ලෙස පීඩාවට පත්ව සිටින ගරු විනිසුරුවරුන් තිස් දෙනෙකුට වැඩි ප්‍රමාණයක් මා හට කතා කොට මා

Scanned with CamScanner

කළ ප්‍රකාශය සම්බන්ධව මා හට ස්තූති කරන ලද්දේ එම කරුණු සියල්ල සත්‍ය නිසා බවත්, ඔවුන් සත්‍ය ලෙසින් ම පීඩාවට පත්ව සිටින නිසා බවත් ය.

තවද ඉහත ප්‍රකාශය නිකුත් කිරීම විනිසුරුවරුන්ගේ කාර්යයට පරිබාහිරව ඔවුන්ට තහනම් කොට ඇති ක්‍රියාවක් වන අතර එම ප්‍රකාශය මගින් 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3 වන වගන්තිය අනුව මාගේ පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද උල්ලංඝනයක් බවත්, පුළුල් අර්ථයෙන් ගත් කළ පාර්ලිමේන්තුවේ සියලු ම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද හා අවසන් වශයෙන් ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාවගේ වරප්‍රසාද උල්ලංඝනය සිදුව ඇත. මා දිගින් දිගටම අධිකරණයේ සහ විනිසුරන්ගේ අයිතිවාසිකම් සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට කටයුතු කළ ආකාරය ජනතාවට රහසක් නොවේ. අතලොස්සක් වූ විනිසුරන්ගේ ක්‍රියාකලාපය නිසා ගෞරවනීය ලෙස කටයුතු කරණ විනිසුරුවන්ගේ අභිමානය කෙලෙසීමට ඉඩ නොතිබීම අපගේ යුතුකම වේ. ඉතා සුලු දෙයකට පවා සමහර විනිසුරුවරුන්ගේ සේවය අත්හිටුවමින් ගජමිතුරන්ගේ වැරැදි සඟවා තැබීම යුක්ති සහගත නොවේ.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3 වන වගන්තිය මෙසේය.

> " 3. පාර්ලිමේන්තුවේදී භාෂණයේ, විවාද කිරීමේ හා කටයුතුවල නිරත වීමේ නිදහස තිබිය යුතු අතර භාෂණයේ, විවාද කිරීමේ හෝ කටයුතුවල නිරත වීමේ නිදහස පාර්ලිමේන්තුවෙන් පිටස්තර වූ යම් අධිකරණයකදී හෝ ස්ථානයකදී දෝෂාභියෝගයට හෝ ප්‍රශ්න කිරීමට භාජනය කළ නොහැකි වන්නේ ය."

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 9 වන වගන්තිය මෙසේය.

> " 9. පාර්ලිමේන්තුවේ සියලුම හා වරප්‍රසාද, පරිහාර සහ බලතල ශ්‍රී ලංකාවේ සාමාන්‍ය හා පොදු නීතියේ කොටසක් විය යුතු අතර ඒවා ආයාචනා වශයෙන් ඉදිරිපත් කිරීම අනවශ්‍ය වන්නේ ය. එහෙත් ශ්‍රී ලංකාවේ සියළුම අධිකරණයන් හි දී ඒවා අධිකරණාත්මක ලෙස පිළිගත යුතුය."

පනතේ 22 සහ 23 වගන්ති අනුව පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංගනය කරනු ලබන තැනැත්තෙකුට වසර දෙකක් නොඉක්මවන සිර දඩුවම සහ/හෝ දඩයකට යටත් කළ යුතු වන්නේ ය.

ඉහත ප්‍රකාශය නිකුත් කර ඇත්තේ අධිකරණමය විෂය පතයේ කොටසක් ලෙස නොව පෞද්ගලික හෝ පෞද්ගලික මට්ටමින් ඇතිකර ගත් බැදියාවක් මත වන නිසා එම ක්‍රියාව පැහිදිලි ලෙසම පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත උල්ලංගනය කිරීමකි.

පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද සම්බන්ද නඩු තීංදු වන Stockdale Vs. Hansard (1839(9) Ad &14 East I, 104), Pepper Vs. Hart 1993(1) All ER 42) නඩු තීංදුවලදී පිළිගත් නිති මූලධර්මය වන්නේ;

> **"The whole of the law and custom of Parliament has its origin from this on maxim, 'that whatever matters arises concerning either House of Parliament ought to be examined, discussed and adjudged in that House to which it relates and not elsewhere.' "**

Scanned with CamScanner

එම නෛතික මූලධර්මය එච්. එන්. ජී. ප්‍රනාන්දු විනිසුරුතමන් නීතිපති එදිරිව සමරක්කොඩි (57 N.L.R. 412 පිටුව) නඩුවේ දී ද පිළිගෙන ඇත.

එම නිසා එකී විනිසුරුවරු දෙදෙනා පාර්ලිමේන්තු ආචාරධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට කැඳවා විමර්ශනයක් සිදු කොට සුදුසු නියෝගයක් නිකුත් කරන ලෙස ගෞරවයෙන් අයැද සිටිමි.

මෙයට

විශ්වාසී

ආචාර්ය විජයදාස රාජපක්ෂ
ජනාධිපති නීතිඥ
කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

ආචාර්ය විජයදාස රාජපක්ෂ
ජනාධිපති නීතිඥ
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය

පිටපත - ගරු අග්‍රවිනිශ්චයකාරතුමන්,

සභාපති, අධිකරණ සේවා කොමිෂන් සභාව,

උපරිමාධිකරණ සංකීර්ණය,

කොළඹ 12

සුදුසු පියවර සඳහා

Scanned with CamScanner